RARE

# සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ තොරතුරු අවශ්‍යතාවය සපුරාලීම සඳහා එම ක්ෂේත්‍රයේ පුස්තකාල ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(බස්නාහිර පළාතේ කර්මාන්තකරුවන් හා විශේෂ පුස්තකාල ඇසුරින්)

කේ.එස්.සී. විජේකෝන්

FGS/L/2001/505R

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1162 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2014 දෙසැම්බර්

# සාරාංශය

රටක ආර්ථික සංවර්ධනයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන එක් අංශයක් ලෙස කර්මාන්ත ක්ෂේත්‍රය හැඳින්විය හැක. එය සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තවලින් සමන්විත ය. ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයට 90% දායකත්වයක් දක්වන සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ආර්ථික සංවර්ධනයේ යාන්ත්‍රණය වශයෙන් සැලකේ. වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 900 ට අඩු හා සේවා නියුක්තිය 300 අඩු කර්මාන්ත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වශයෙන් නිර්වචනය කර ඇත.

කර්මාන්ත ක්ෂේත්‍රය රටක ආර්ථික සංවර්ධනයේ ඉලක්ක ගණනය කිරීමේ මූලික සාධකය කි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ නව කර්මාන්ත ආරම්භ කිරීම සහ පවත්නා කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා පැමිණෙන සේවාලාභීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා තෝරාගත් පුස්තකාල 5ක් විසින් ඉටු කරනු ලබන සේවාවන් ඇගයීමට ලක් කිරීම යි. පුස්තකාල 5ක් පමණක් තෝරාගැනීමට සිදු වූයේ මෙම ක්ෂේත්‍රයේ කර්මාන්ත තොරතුරු තැන්පත් වී ඇති ප්‍රධාන පුස්තකාල වීමයි. රටක සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා කාර්මික තොරතුරු ඉතාමත් වැදගත් ය. එවන් තොරතුරු සපයනු ලබන විශේෂ පුස්තකාල සේවාවන්ගේ කාර්යභාරය මෙන්ම ඵලදායීතාව ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීම කාලෝචිත ය. විශේෂයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා නව තාක්ෂණික දැනුම, කර්මාන්තකරුවන්ගේ විභවයන් පුළුල් කිරීමේ හැකියාව සමග පුස්තකාල සේවාවන් සතුව පැවතීමේ ස්වභාවයන් සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෙබඳු ස්ථානයක පවතින්නේ ද යන්න මෙමගින් අධ්‍යයනය කෙරිණ. ඊට අමතරව පුස්තකාල සේවාවන්ගේ වැඩි දියුණු කළ යුතු වූ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමත් සේවාලාභීන්ට කාර්යක්ෂම වූ පුස්තකාල සේවාවක් පවත්වා ගෙන යායුත්තේ කෙසේද යන්න පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් කරුණු විග්‍රහ කර ඇත.

2013 වර්ෂයට අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශය11.1% ක් දායක වන අතර කර්මාන්ත අංශයෙන් 30.4% කි. සේවා අංශය 58.5% ද දායකත්වයක් දක්වයි. කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය මුළු ශ්‍රම බලකායෙන් 25% කි. මෙම ක්ෂේත්‍රය නිෂ්පාදනවලින් 48% ක් ආහාර පාන නිෂ්පාදන කර්මාන්ත වේ. රෙදිපිළි හා සම් භාණ්ඩ 23% කි. රසායනික ද්‍රව්‍ය මෙන්ම ඛනිජ තෙල් නිෂ්පාදන 15% පෙන්නුම් කරයි. ලෝහ නිෂ්පාදන හා යන්ත්‍රෝපකරණ 9% ක අගයක් ගනී.

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක අධ්‍යයන කි. ව්‍යුහගත හා ව්‍යුහගත නොවූ ප්‍රශ්නාවලී දෙකකට අමතරව විධිමත් හා අවිධිමත් සම්මුඛ සාකච්ඡා මෙන්ම නිරීක්ෂණය හා සිද්ධි අධ්‍යයනය ආදී ක්‍රමවේදයන් යොදා ගැනුණි. ශ්‍රී ලංකාවේ විශේෂ පුස්තකාල 65ක් ස්ථාපිත වී ඇති අතර එයින් බස්නාහිර පළාතේ තිබෙන පුස්තකාල 52න් කොළඹ දිස්ත්‍රික්කයේ විශේෂ පුස්තකාල 5ක් අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරාගැණින. බස්නාහිර පළාතෙන් තොරතුරු ලබා ගැනීම සඳහා පුස්තකාලවලට පැමිණි සේවාලාභින් 500 ක සංගහනය තුළින් 100 දෙනෙක් සඳහා මෙන්ම පුස්තකාලයාධිපතිවරුන් 5 දෙනෙකු නියැදිය වශයෙන් යොදා ගැනුණි.

දත්ත විශ්ලේෂණයට අනුව ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව පුස්තකාල පරිහරණය කළ සේවාලාභින් ගෙන් 64% ක් ම නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට පැමිණි අය වේ. පවතින කර්මාන්ත වැඩි දියුණු කර ගැනීමට තොරතුරු අපේක්ෂාවෙන් පැමිණි ප්‍රමාණය 20% කි. මෙම සේවාලාභීන් පුස්තකාල භාවිතයේ දී නව තාක්ෂණික තොරතුරු මෙන්ම යාවත්කාලීන වූ තොරතුරු නොමැතිවීම සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනයට පවතින ප්‍රධාන බාධකයක් බවට අනාවරණය විය. නව කර්මාන්ත ආරම්භ කිරීමට පුස්තකාලවලට පැමිණි සේවාලාභීන්ගෙන් 43% ම ආහාර පාන ආශ්‍රිත කර්මාන්ත සම්බන්ධයෙන් තොරතුරු අපේක්ෂාවෙන් පැමිණි අය වූහ. ශ්‍රී ලංකාවේ කර්මාන්ත අතර ආහාර පාන නිෂ්පාදන කර්මාන්ත වැඩි වශයෙන් කේන්ද්‍රගත වී ඇත. එම කර්මාන්ත හැරුණු විට අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා ද කර්මාන්තකරුවන් යොමු කිරීමට පුස්තකාල සේවාව මගින් නව තාක්ෂණික දැනුම යාවත්කාලීන කරමින් ලබා දීම අත්‍යවශ්‍ය ය. පවත්නා කර්මාන්තවල ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය දැනුම පුස්තකාල සේවාව මගින් සැපයීම පමණක් නොව කළමනාකරණය, ව්‍යවසායකත්වය හා වෙළඳපොළ ඉඩප්‍රස්ථා පිළිබඳව ද ඔවුන්ට පුළුල් අවබෝධයක් ලබාදීමට තොරතුරු සැපයිය යුතුව ඇත. මීට අමතරව රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන්හි ප්‍රතිපත්ති තීරකයන්ගේ සක්‍රීය ක්‍රියාකාරීත්වය අත්‍යවශ්‍ය බව වැඩිදුරටත් අනාවරණය විය. මෙම අධ්‍යයනයේ නිර්දේශ සහ නිගමන කර්මාන්ත ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවවලට ප්‍රයෝජනවත් වේ.

*ප්‍රමුඛ පද:* ආර්ථික සංවර්ධනය, කාර්මික සංවර්ධනය, ව්‍යවසායකත්වය, විඥාපන පරිවපනය, විශේෂ පුස්තකාල, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත, සේවා නියුක්තිය